**වවුනියාව නගර සභාව**

**වවුනියාව දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 20**20** පෙබරවාරි **28** දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර**,**එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව පිළිවෙලින් 2020 ජූනි 22 දින හා 2020 ජූලි 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වවුනියාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 10 කට වැඩි කාලයක සිට ඉඩම් 40 ක වටිනාකම අගය කර ගිණුම්වලට නොගැනීම නිසා මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වටිනාකම අවතක්සේරු වී තිබුණි. | සභාවේ සියලුම වත්කම් වටිනාකම් සඳහන් කර ගිණුම්වල හෙළිදරව් කළ යුතුය. | සභාව විසින් පරිහරණය කරන ලද ඉඩම් 40 න් 15 ක් අප වෙත පවරා ඇති අතර ඉතිරි ඉඩම් පවරා දෙන ලෙස වවුනියාව ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ඉල්ලා ඇත. කෙසේ වෙතත්, ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව අප වෙත මේ දක්වා දන්වා නොතිබුණි. |

**(ආ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛණ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.626,776,162 ක් වටිනා ගිණුම් අයිතම තුනක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් ශේෂයන් සහතික කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. | ඔවුන් සඳහන් කළ රු.626,776,162 ක අගය ඉඩම් ගොඩනැගිලිවලට අදාළ වේ. නගර සභාවට අයත් ඉඩම් තක්සේරු කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ තක්සේරු දෙපාර්තමේන්තුව හරහා කටයුතු සිදු කෙරේ. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| **(අ)** | **නගර සභා ආඥා පනත** III වන පරිච්ඡේදයේ 54 (2) වගන්තිය | නියමිත වේලාවට අයකර ගැනීම් සිදු කර නොතිබුණි. | නගර සභා ආඥා පනතේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | දේපල බදු හිඟ මුදල් අයකිරීමේ නිලධාරීන් විසින් අඛණ්ඩව එකතු කරනු ලැබේ. ක්ෂේත්‍ර පරීක්ෂාව මගින් පෙර ශේෂයන් එකතු කරනු ලැබේ. |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i) මුදල් රෙගුලාසි 751(2) | සභාවේ විදුලි උපකරණ අයිතම ඇතුළත් කිරීම සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛනයක් වෙන වෙනම පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි වල උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | සභාවේ විදුලි උපකරණ සඳහා වෙන වෙනම ඉන්වෙන්ට්‍රි තබා ඇති අතර ඒවායේ සටහන් කර නොමැත. |
| | (ii) මුදල් රෙගුලාසි 751(2) සහ (3) | වටිනාකම රු.565,921 ක් වූ කල් ඉකුත්වූ තැන්පතු 14 ක් සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි වල උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | ආපසු ගෙවිය යුතු කාල සීමාව ඉක්මවා ගිය සියලුම තැන්පතු පියවා ඇත. අදාළ බලධාරීන්ගේ අවසරයකින් තොරව ඉදිකරන ලද ගොඩනැගිලි සඳහා UDA තැන්පතු තවත් සමහරකි. තැන්පතුවලින් වාර්ෂිකව 10% ක් අඩු කර සුදුසු ක්‍රියාමාර්ග ගන්නා තෙක් සභාවේ ආදායමට මාරු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (iii) මුදල් රෙගුලාසි 371(5) | අත්තිකාරම් ගිණුමේ දීර්ඝ කාලයක් තිස්සේ ඉතිරිව තිබූ රු.74,084 ක මුදලක් පියවා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි වල උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් රාජකාරියේ යෙදී සිටින නිලධාරීන්ගෙන් පැහැදිලි කිරීම් ලැබී ඇති අතර පසු විපරම් ක්‍රියාමාර්ග ගනිමින් සිටී. |
| **(ඇ)** ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 178(3) වගන්තිය | ඵලදායී ලෙස කොන්ත්‍රාත් කටයුතු සිදුකරන ප්‍රජා පාදක සංවිධාන සහ ප්‍රජා මධ්‍යස්ථානවල නම් ඇතුළත් ලේඛනයක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | කාර්යක්ෂමව කොන්ත්‍රාත් වැඩ සිදු කළ ප්‍රජා මට්ටමේ සංවිධාන සහ ප්‍රජා මධ්‍යස්ථාන හඳුනාගෙන ඇති අතර 2020 සිට නිසි වාර්තාවක් පවත්වා ගෙන යනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.69,326,342 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.71,516,844 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 23,562,046 | 63,089,570 | 23,622,569 | 39,527,523 | 23,512,046 | 24,788,149 | 23,383,989 | 41,245,333 |
| කුලී | 41,276,025 | 44,789,248 | 31,532,168 | 3,513,223 | 42,058,834 | 36,094,056 | 35,901,420 | 5,300,770 |
| බලපත්‍ර ගාස්තු | 2,565,000 | 2,565,000 | 2,410,455 | - | 2,510,000 | 2,167,702 | 2,167,702 | - |
| වෙනත් ආදායම් | 65,095,000 | 105,964,407 | 72,611,420 | 40,869,407 | 56,331,000 | 54,783,351 | 63,185,799 | 36,594,039 |
| එකතුව | **132,498,071** | **216,408,225** | **130,176,612** | **83,910,153** | **68,137,211** | **117,833,258** | **124,638,910** | **83,140,142** |

## 2.2.2 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| අයවැය ඇස්තමේන්තුව නිසි ලෙස සකස් කර සැලසුම් කර වැඩසටහන්ගත කර නොතිබීම හේතුවෙන් අයවැයගත ආදායම සහ තථ්‍ය ආදායම අතර රු.60,523 ක සිට රු.9,743,857 ක් දක්වා විචලනයන් සිදුවිය. | අයවැය නිසි ලෙස සකස් කළ යුතුය. | පිළිතුරු ලබාදී නොතිබුණි. |

## 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පසුගිය වසර 01 සිට 05 දක්වා කාලය තුළ එකතු වටිනාකම රු.38,195,296 ක් වූ හිඟ වරිපනම් හා බදු අයකර ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව නිරීක්ෂණය වූ අතර දේපල සඳහා බදු නැවත තක්සේරු කිරීම ද පසුගිය වසර 07 තුළ සිදු කර නොතිබීම හේතුවෙන් වරිපනම් සහ බදු සහ හිඟ අයකර ගැනීමේ නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය. | වරිපනම් සහ බදු අයකර ගැනීමට පියවර ගත යුතු අතර නැවත තක්සේරු කිරීම ද සිදු කළ යුතුය. | හිඟ අයකිරීම් සඳහා අයකිරීම් නිලධාරියාට හිඟ වාරික ලැයිස්තු නිකුත් කර ඇති අතර බොහෝ ජංගම සේවාවන් ද සිදු කර ඇති බව තහවුරු කරන බව. |

## 2.2.4 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පසුගිය වසර 01 සිට 05 දක්වා කාලය තුළ ලැබිය යුතු රු.3,513,223 ක කුලී අය කර ගැනීමට සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සභාවේ විෂය පථය යටතේ වූ සියලුම කුටිවල කුලී අය කර ගැනීමට පියවර ගත යුතුය. | එකතු කළ යුතු රු.1,765,167 ක් වූ හිඟ බදු කුලී එකතු කර ඇති අතර හිඟ මුදල් පියවා ගැනීමට කටයුතු කරමින් සිටී. |
| (ආ) | පසුගිය වසර 01 සිට 47 දක්වා කාලය තුළ කුලියට දුන් සභාවට අයත් කුටි 58 ක් සම්බන්ධයෙන් කුලී ගිවිසුම්වලට ඇතුළත්ව නොතිබුණි. | කුලී ගිවිසුම්වලට එළඹීමට පියවර ගත යුතුය. | ගිවිසුම්වලට ඇතුලත් නොවුණු කුටි අතරින් බොහෝ කුටි මාරු කර ඇත. තවද, කුටි විකුණා හෝ කුලියට දී තිබුණු අතර සමහරුන් විදේශගතව සිටි බැවින් ගිවිසුම් අත්සන් කර |

| | | |
|---|---|---|
| | | නොතිබුණි. ඊට අමතරව, අප වෙත දැනුම් නොදී හිමිකාරිත්වය පැවරීම සම්බන්ධයෙන් අඛණ්ඩ ක්‍රියාමාර්ග ගන්නා බව ඔබට දන්වමි. |
| (ඈ) කුලියට දුන් කුටි 315 ක සහ ඉඩම්වල කොන්ත්‍රාත් කාලය අවසන් වී වසර 01 සිට 33 දක්වා කාලයක් ගතවී තිබුණි. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් නැවත කොන්ත්‍රාත්තුවක් අත්සන් කිරීමෙන් තොරව ඒවා භාවිතා කරමින් පැවතුණි. | නැවත ගිවිසුම්වලට එළඹීමට පියවර ගත යුතුය. | ගිවිසුම්වලට ඇතුළත් නොවූ කුටිවලට දැන්වීම් නිකුත් කරමින් කොන්ත්‍රාත්තු අලුත් කිරීමට පියවර ගනිමින් සිටී. |

**2.2.5 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු**

**(අ) උසාවි දඩ මුදල්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.20,718,657 ක උසාවි දඩ මුදලක් පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියලු බලධාරීන්ගෙන් අයවිය යුතුව තිබුණි. | නියමිත කාල සීමාව තුළ උසාවි දඩ මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. | 2019 ඉතිරි කාර්තුව සඳහා අයවිය යුතු උසාවි දඩ මුදල වන රු.4,472,643 ක ශේෂයක් 2021 වර්ෂයේදී ලබා ගත හැකිවනු ඇත. වෙනත් ශේෂයන් අයකර ගැනීමට පියවර ගෙන ඇති බව කරුණිකව දන්වමි. |

**(ආ) මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.20,150,750 ක මුද්දර ගාස්තු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියලු බලධාරීන්ගෙන් අයවිය යුතුව තිබුණි. | නියමිත කාල සීමාව තුළ මුද්දර ගාස්තු අය කර ගැනීමට පියවර ගත යුතුය. | 2019 වර්ෂය සඳහා මුද්දර ගාස්තු හිඟ මුදල තහවුරු කර ගැනීම සඳහා ලිපියක් වවුනියා දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යවා ඇත. ඉඩම් වාර්තා සඳහා තහවුරු කිරීමක් ලැබුණු වහාම මේ සඳහා ගාස්තුව ලබා ගැනීමට පියවර ගන්නා බව කරුණාවෙන් ඔබට දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

----------------

මහජන සෞඛ්‍ය, මහජන උපයෝගීතා සේවා සහ මහජන මංපෙත් විධිමත් කිරීම සහ සුවපහසුව, පහසුව සහ ජනතාවගේ සුභසාධනය වැනි කාරණා විධිමත් කිරීම සහ පාලනය කිරීම වැනි නගර සභා ආඥාපනතේ 4 වගන්තිය යටතේ ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිරීක්ෂණය කළ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරකම් ඉටුකිරීමේ ප්‍රමාදය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සිදු කරන ලද රු.43,237,143 ක් වටිනා කොන්ත්‍රාත් වැඩ විසි හතක් සමාලෝචිත වර්ෂය තුළ අවසන් කර නොතිබුණි. කෙසේ වෙතත්, ඒ සඳහා හේතු විගණනය සඳහා ලබා දී නොතිබුණි. | සැලසුම් කර ඇති වැඩවලට අනුව නියමිත කාල සීමාව තුළ වැඩ නිම කිරීමට පියවර ගත යුතුය. | සභාවේ යෝජනාවට අනුව ප්‍රජා මධ්‍යස්ථාන හරහා වැඩ කොටසක් ලබාදෙන ලද නමුත් බොහෝ වැඩ කටයුතු ඔවුන් විසින් අවසන් කර නොතිබුණි. එසේම, අපගේ විවෘත ආරාධනා තිබියදීත්, 'කේම්බරාලියා' ව්‍යාපෘතියේ වැඩ කටයුතු කරගෙන යාමට කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් නොවීය. මේ හේතුවෙන් සමුපකාර සමිතිය හරහා වැඩ කටයුතු අවසානයේ ක්‍රියාත්මක විය. |

#### (ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | කසළ බැහැර කරන ස්ථාන සඳහා පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | බලපත්‍රය ලබා ගත යුතුය. | මධ්‍යම පරිසර අධිකාරිය සමඟ මේ ගැන සාකච්ඡා කරන ලද අතර යම් යම් සංශෝධන හා සංවර්ධන කටයුතු සිදු කිරීමෙන් පසු පරිසර බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කරනු ඇත. |
| (ii) | අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් නිලධාරීන්ට පුහුණුවක් ලබා දී නොතිබුණි. | නිලධාරීන්ට පුහුණුව ලබා දිය යුතුය. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව අතීතයේ දී කම්කරුවන් පුහුණු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (iii) | අපද්‍රව්‍ය කළමනාකරණයට අවශ්‍ය තොරතුරු හා දත්ත පද්ධතියක් සභාව විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දත්ත හා තොරතුරු ක්‍රමානුකූලව සකස් කළ යුතුය. | මේ හා සම්බන්ධ නිසි දත්ත වාර්තා පවත්වාගෙන යනු ලැබේ. තවදුරටත් දත්ත පදනම් කරගත් ක්‍රම සොයමින් සිටී. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා "කේ" ආකෘති පත්‍රය මුද්‍රණය කිරීම හා සැපයීම සඳහා සභාව විසින් රු.9,729 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත්, එම ආකෘති පත්‍ර නිකුත් කළ නිලධාරීන් කාර්යක්ෂමව කටයුතු කර නොතිබීම හේතුවෙන් ආකෘති පත්‍ර 1692 ක් සභාව තුළ ඉතිරිව තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ආකෘති පත්‍ර සම්පූර්ණයෙන් නිකුත් කිරීමට පියවර ගත යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |
| (ආ) | පරිත්‍යාගයක් ලෙස ලැබුණු වාහන දෙකක ලියාපදිංචි සහතික නොතිබුණි. | වත්කම්වල හිමිකාරීත්වය සහතික කළ යුතුය. | අපගේ සභා යෝජනා අංක. VUC / 2019/11/25 අනුව වාහන දෙකම භාවිතයට ගත නොහැකි බැවින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට ලබා දීමට පියවර ගෙන තිබේ. |
| (ඇ) | වටිනාකම රු.474,293 ක් වූ පුස්තකාල ගොඩනැගීමේ අරමුදල පසුගිය වසර 05 තුළ අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගෙන සාමාන්‍ය තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | අදාළ නීතිරීතිවල උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | එක් තැන්පතුවක් පමණික් පුස්තකාල තැන්පතුවක් ලෙස ඇත. අනෙක් තැන්පතු පොදු තැන්පතුවක් ලෙස තබා ඇත. ස්ථාවර තැන්පතු පොළිය ආදායමක් ලෙස මණ්ඩලයට ලබා ගත හැකි බවත් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය වූ විට භාවිතා කරන බවත් කරුණාවෙන් දන්වනු කැමැත්තෙමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුද්ගලයෙකු විසින් සභාවට අයත් පර්චස 7 ක ඉඩමක් ස්වාධීනව අත්පත් කර ගෙන එහි ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් තිබුණි. නගර සභා ආඥා පනතේ 255 වගන්තිය ප්‍රකාරව මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වත්කම්වල හිමිකාරිත්වය සහතික කළ යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| **(අ)** | **සේවක පුරප්පාඩු** | | |
| | 2018 දෙසැම්බර් 31 දිනට සභාවේ පුරප්පාඩු තිස් හතක් පුරවා නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතුය. | බාහිරව පිරවිය හැකි පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවසරය ලබා ගැනීම සඳහා ලිපියක් යවා ඇත. පත්වීම කළ හැක්කේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණි. නැවත දැනුම් දීමක් සිදු කරන තෙක් පත්වීම් සිදු නොකරන ලෙස භාණ්ඩාගාර ලේකම්වරයා ඔවුන්ගේ 2019.11.20 දිනැති චක්‍රලේඛ අංක. DMS/Policy/Recruitments මගින් උපදෙස් දී තිබේ. |
| **(ආ)** | **සේවක ණය** | | |
| | සේවයෙන් ඉල්ලා අස්වූ, විශ්‍රාමයාමෙන් පසුව මියගිය නිලධාරීන් 02 ගෙන් අයවීමට තිබුණු රු.93,795 ක සේවක ණය හිඟ මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් අර්ථවත් හා නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ කාර්ය මණ්ඩල ණය හිඟ මුදල් අය කර ගැනීමට පියවර ගත යුතුය. | සේවයෙන් පහ කරන ලද නිලධාරියාගේ හිඟ ණය ආපසු අයකර ගැනීම සඳහා ඔහුගේ E.T.F ගෙවීමේ වටිනාකම අදාල අරමුදලෙන් අයදුම් කිරීමට හා ලබාගැනීමට පියවර ගෙන ඇත. |

**(ඇ) සේවක ඇප තැන්පතු**

-------------------------

| | | |
|---|---|---|
| නිලධාරීන් දෙදෙනෙකු දීර්ඝ කාලයකට පෙර සභාවෙන් ඉල්ලා අස්වී තිබුණි. කෙසේ වෙතත්, සේවක ඇප තැන්පතුවල ඇතුළත් රු.16,153 ක මුදලක් ආපසු ගෙවීමට පියවර ගෙන නොතිබුණි. | ඇප මුදල් ආපසු ගෙවීමට පියවර ගත යුතුය. | නැවත ඉල්ලීම පරිදි, ප්‍රධාන පුස්තකාලයාධිපතිවරයා ප්‍රකාශ කළේ පුස්තකාලයේ ඇති සමහර පොත් නැතිවූ බැවින් කාර්ය මණ්ඩලයේ ඇප නිදහස් කළ නොහැකි බව වන අතර එබැවින් කමිටුවක් පිහිටුවා අදාළ කමිටුවේ නිර්දේශ ලබා ගෙන අදාල නිලධාරීන්ගෙන් එකතුකර ගැනීම සඳහා පියවර ගන්නා බවය. දඩ මුදල ගෙවීමෙන් පසු සේවක ඇප ගෙවීමට පියවර ගන්නා බව ඔබට දැනුම් දීමට කැමැත්තෙමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| | --------------------- | ----------- | ------------------------------------- |
| (අ) | සභාවේ විෂය පථය යටතේ දේපල නැවත තක්සේරු කිරීම සහ දේපල සඳහා තක්සේරු බද්ද අයකර ගැනීමට පසුගිය වසර 08 ක කාලය තුළ කිසිදු අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | දේපල නැවත තක්සේරු කිරීම සඳහා පියවර ගත යුතුය. | නාගරික ප්‍රදේශවල දේපල නැවත තක්සේරු කිරීම සඳහා නැවත නැවතත් බදු දෙපාර්තමේන්තුවට ලිපි යවා ඇති නමුත් මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ආ) | මේ දක්වා ගොඩනැඟීම සඳහා අනුමැතිය ලබා ගත් පුද්ගල පාර්ශව 327 කට අනුකූලතා සහතිකයක් නිකුත් කිරීමට සභාව පියවර ගෙන නොතිබුණි. | අදාළ නීතිරීතිවල උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | අනුකූලතා සහතිකය නිකුත් කරනු ලබන්නේ ගොඩනැගිලි බලපත්‍ර ලබාගෙන ඉදිකිරීම් අවසන් කර ඒවා සඳහා ඉල්ලුම් කිරීමෙන් පසුව පමණි. මෙය අනාගතයේදී මග පෙන්වීමක් වනු ඇත. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම් වාර්තා කිරීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි 50 ක් සම්බන්ධයෙන් අනාවරණය කිරීම් සිදු කර නොතිබුණු අතර ඉඩම් හා ගොඩනැගිලි ලියාපදිංචි කිරීම ද සභාව විසින් නිසි පරිදි පවත්වා ගෙන ගොස් නොතිබුණි. ඉඩම් හා ගොඩනැගිලි නිසි ලෙස සත්‍යාපනය කිරීමෙන් සභාවට අයත් එවැනි වත්කම්වල අයිතිය සහතික කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි සත්‍යාපනය කළ යුතු අතර සභාවට අයත් වත්කම්වල අයිතිය සහතික කළ යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

### 3.5.2 නඩත්තු කිරීම් හා අළුත්වැඩියා කිරීම් සිසුකිරීමට අසමත් වීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| සභාවේ වාහන දහයක් දීර්ඝ කාලයක සිට නිශ්ක්‍රියව පැවතුනි. මේ දක්වා නිසි ක්‍රියා පටිපාටියක් අනුගමනය කරමින් ඒවා භාවිතා කිරීමට හෝ විකිණීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඒවා භාවිතයට ගත හැකි ආකාරයෙන් අළුත්වැඩියා කිරීමෙන් හෝ විකිණීම සඳහා කටයුතු කළ යුතුය. | අපහරණ මණ්ඩලය විසින් මෙම වාහන විකිණීම සඳහා නිර්දේශ කර ඇති අතර, ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා අයදුම්පත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට 2018 වර්ෂයේදී යවා ඇත. කෙසේ වෙතත්, දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය හේතුවෙන් නැවත අයදුම් කිරීමට පියවර ගනිමින් සිටී. ලියාපදිංචිය අවලංගු කිරීමෙන් පසු මෙම වාහන විකුණනු ලැබේ. |

### 3.5.3 නිශ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- | --- |
| (අ) | වටිනාකම රු.2,634,997 ක් වූ භාණ්ඩ වසර 04 කට වැඩි කාලයක සිට සභාවට අයත් ගබඩාවේ නිශ්ක්‍රියව පැවතුනි. | භාවිතයට පියවර ගත යුතුය. | 2018 වර්ෂයේදී සභා ගබඩාවේ රු.3,122,254 ක් වටිනා භාණ්ඩ තිබුණද, රු.487,257 ක් වටිනා භාණ්ඩ භාවිතා කරන ලදී. නිරන්තරයෙන් භාවිතා කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කුරුමන්කාඩු වැඩිහිටි උද්‍යානය 2018 ජුනි 18 දින නිශ්චිත සංවර්ධන ප්‍රදාන වැඩ සැලැස්ම යටතේ සභාව විසින් රු.2,534,837 ක වියදමින් නිම කර තිබුණි. කෙසේ වෙතත් එය මේ දක්වා නිශ්කාර්යව පැවතුනි. | එය භාවිතා කිරීමට පියවර ගත යුතුය. | කුරුමන්කාඩු වැඩිහිටි උද්‍යානයේ තවත් අත්‍යවශ්‍ය වැඩ කිහිපයක් සම්පූර්ණ කළ යුතු බැවින් ඒවා අවසන් වූ පසු එය උපරිම ප්‍රයෝජනට ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**3.5.4 අත්පත් කර නොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | සභාවට පරිත්‍යාග කරන ලද වාහන 03 ක අයිතිය පවරා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීම සඳහා සුදුසු පියවර ගත යුතුය. | නියමිත වේලාවට වවුනියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා අපගේ සභාවට අයිතිය පවරා ගැනීම සඳහා වාහන තුනම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට යොමු කරන ලදී. එ් සඳහා දීර්ඝ කාලයක් ගත නොවනු ඇත. |
| (ii) | සභාවේ කාර්යාලය, සුසාන භූමි, පුස්තකාලය, ක්‍රීඩා පිටිය, පොදු වෙළඳපොල සහ ප්‍රජා මධ්‍යස්ථානය වැනි ඉඩම් 50 ක අයිතිය පවරා ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීම සඳහා පියවර ගත යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

**3.5.5 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2009 නොවැම්බර් 13 දිනැති අංක.438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පසුගිය වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ භාවිතයට ගත නොහැකි යැයි සඳහන් කර ඇති භාණ්ඩ වර්ග 342 සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | පසුගිය වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් භාවිතයට ගත නොහැකි ලෙස නම් කළ භාණ්ඩ 342 සම්බන්ධයෙන් 2009 අංක. 438 හා අංක. 43 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අනුව මිල තක්සේරු කර ඇත. 2020.03.27 දින වෙන්දේසිය පවත්වන ලද අතර කඩා බිඳ දැමීමේ කටයුතු අවසන් කර ඇති නමුත් COVID-19 හේතුවෙන් එය අවසන් කර නොමැත. |

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තු කර තිබුණු හා ආරම්භ කරන ලද රු.3,576,226 ක් වූ ඉදිකිරීම් කටයුතු 24 ක් මෙම විගණනයේ දිනය දක්වා අවසන් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| අයවැය වියදම් සහ තථ්‍ය වියදම් අතර රු.18,786 ක සිට රු.13,468,119 ක් දක්වා වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය කළමනාකරණයේ පාලන මෙවලමක් ලෙස භාවිතා කර නොමැති බව පෙන්නුම් කෙරිණි. | අයවැය ඇස්තමේන්තුව නිසි ලෙස සකස් කළ යුතුය. | පුද්ගලික ගණනය කිරීම් සඳහා අයවැය සකස් කරන අතරම සේවකයින් 183 ක් සඳහා අනුමත කාර්යමණ්ඩලය සකසමින් ඇත. කෙසේ වෙතත්, ගෙවීම් සිදු කරනු ලබන්නේ සත්‍ය සේවක සංඛ්‍යාව පදනම් කර බැවින් අයවැය වටිනාකම සහ තත්‍ය වටිනාකම අතර වෙනසක් ඇත. |